විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මැලිගාවත්ත කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2009 දිනය / திகதி / Date 2010- 03- 22

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02/ 2010**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**2004.01.02 - 2004.12.02 දක්වා කාලය තුළ**
**විශ්‍රාම ලැබූ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ගෙවීම**

2003- 12- 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/ 2003 අනුව රජයේ සේවයේ නිලධාරීන්ට 2004- 01- 01 දින සිට වැටුප් වැඩිවීමක් හිමි විය. නමුත් එම වැටුප් වැඩිවීම පොදු චක්‍රලේඛ 1-2/ 2004 මඟින් වැටුප් වැඩිවූ නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ට හිමි නොවීය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/ 2003 අනුව එතෙක් 8 ලක්ෂ බාණ්ඩයේ විශ්‍රාම වැටුප් අංක ලබා දීම අවලංගු කර 2004- 01- 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2004- 01- 16 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/ 2004 මඟින් 9 ලක්ෂ බාණ්ඩයට අයත් විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම ක්‍රියාත්මක විය.

2004- 01- 02 සිට 2004- 12- 01 දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන්ට 9 ලක්ෂ බාණ්ඩයේ විශ්‍රාම වැටුප් අංක ලබා නොදුන් අතර, ඔවුන්ට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 1/ 98 මඟින් ලබා දුන් 8 ලක්ෂ බාණ්ඩයේ අංකම ලබා දුනි.

මේ හේතුව මත 2004- 01- 02 සිට 2004- 12- 01 දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශ්‍රාමිකයින්ට 8 ලක්ෂ බාණ්ඩයේ විශ්‍රාම වැටුප් අංක නිකුත් කිරීම නිසා ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් 2004- 01- 01 දින සිට ක්‍රියාත්මක වන 2003- 12- 31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 17/ 2003 මඟින් ලබා දුන් 10% ක වැටුප් වැඩිවීම ලබා දී විශ්‍රාම වැටුප් ගණනය කර ඇති අතර, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 17/ 2003 ප්‍රකාරව 2004- 01- 01 දිනට පෙර විශ්‍රාම ගිය නිලධාරීන්ට ගෙවන ලෙස ලබා දී ඇති උපදෙස් මත මෙම වැටුප් වැඩිවීම ලබා නොදී විශ්‍රාම වැටුප් ගණනය කිරීම ඇතැම් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කර ඇත.

එබැවින් 2004- 01- 02 සිට 2004- 12- 01 දක්වා කාලය තුළ විශ්‍රාම ලැබූ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ 8 ලක්ෂ බාණ්ඩයේ විශ්‍රාම වැටුප් අංක හිමි විශ්‍රාමිකයින් සඳහා ද 2003- 12- 31 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 17/ 2003 මඟින් ලබා දී ඇති 10% වැටුප් වැඩිවීම ලබාදිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
03. ලේකම් - සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය
04. විගණකාධිපති.



| | Telephone | Fax |
|---|---|---|
| Director General | 2431647 | 2342078 |
| Director | 2432008 | 2342078 |
| Director (F) | 2434974 | 2391403 |
| Internal Auditor | 2329634 | 2329634 |

| | Telephone | Fax |
|---|---|---|
| W&OP | 2332346 | 2432214 |
| PSPF | 2324375 | 2332347 |
| L.G.U. | 2342525 | 2342525 |
| Registration | 2329178 | - |

| | Telephone |
|---|---|
| Policy | 2329580 |
| Forces | 2320439 |
| Computation | 2434414 |
| Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk